සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා මහ බැංකුවට කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2018

(02) සාමාන්‍ය බුද්ධිය

පැ එකයි

විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



* පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

1 2 3 4

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.

....

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....

වැදගත් :

- * මෙම ප්‍රශ්න පත්‍රය පිටු **11** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.
- * ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- * ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
- * ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
- * දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.
- * ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතු ය.
- * ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
- * මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
- * අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

පිටුව	ප්‍රශ්න අංකය	ලකුණු
2	1 - 10	
3	11 - 16	
4	17 - 20	
5	21 - 25	
6	26 - 30	
7	31 - 33	
8	34 - 37	
9	38 - 42	
10	43 - 47	
11	48 - 50	
එකතුව		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරින්	

උත්තර පත්‍ර පරීක්ෂක	
ලකුණු පරීක්ෂා කළේ	

[2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

- අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ පද යුගල හතරක් බැගින් දී ඇත. ඒවා අතුරින් පද යුගල තුනක ම ඒවායේ ඇතුළත් පද එකිනෙක අතර කිසියම් සමාන සම්බන්ධතාවක් පෙන්නුම් කරයි. එසේ සමාන සම්බන්ධතාවක් පෙන්නුම් නොකරන ඉතිරි පද යුගලය තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත්** ඉර මත ලියන්න.

1. (1) මුවා - නරියා (2) සිංහයා - පිඹුරා
   (3) බළලා - බල්ලා (4) කොටියා - නයා (.........)

2. (1) දරුවා - මව (2) නගරය - වැසියා
   (3) දුම - ගින්න (4) දැනුම - ගුරුවරයා (.........)

3. (1) වේගමානය - දුර (2) උෂ්ණත්මානය - උෂ්ණත්වය
   (3) පීඩනමානය - පීඩනය (4) ආර්ද්‍රතාමානය - සාපේක්ෂ ආර්ද්‍රතාව (.........)

4. (1) සපත්තු - සම් (2) මේසය - ලී
   (3) බිත්තිය - ගඩොල් (4) ගස - අතු (.........)

5. (1) රත්නපුර - නිවිතිගල (2) කළුතර - පානදුර
   (3) යාපනය - චාවකච්චේරි (4) තඹුත්තේගම - අනුරාධපුරය (.........)

- අංක **6** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ කිසියම් රටාවකට පිළියෙල කරන ලද සංඛ්‍යා පෙළක් බැගින් දී තිබේ. එම රටාව අනුව **?** සලකුණ සහිත ස්ථානයට යෙදෙන වඩාත් ම සුදුසු සංඛ්‍යාව තෝරා එම සංඛ්‍යාවට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත්** ඉර මත ලියන්න.

6. 3 , 8 , 15 , 24 , 35 , ...?....
   (1) 45 (2) 47 (3) 48 (4) 65 (.........)

7. 31 , 29 , 24 , 22 , 17 , ...?.... , 10
   (1) 12 (2) 10 (3) 8 (4) 15 (.........)

8. 2 , 5 , 10 , 17 , 26 , 37 , ...?....
   (1) 45 (2) 50 (3) 58 (4) 70 (.........)

9. 1 , 3 , 4 , 7 , 11 , 18 , 29 , ...?....
   (1) 34 (2) 42 (3) 47 (4) 52 (.........)

10. 8 , 12 , 24 , 60 , 168 , ...?....
    (1) 150 (2) 492 (3) 880 (4) 1024 (.........)

කටුවැඩ සඳහා

[3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

3215

- අංක **11** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත** ලියන්න.

11. ඉරිදාට දින හතරකට පෙර දිනය අනිද්දා වේ. අද දවස කුමක් ද?

(1) සඳුදා (2) අඟහරුවාදා (3) බදාදා (4) ඉරිදා (.........)

- ප්‍රශ්න අංක **12** සහ **13** පහත දී ඇති තොරතුර මත පදනම් වේ.

කොළ පාටින් පින්තාරු කරනු ලැබූ අඟල් $3 \times 3 \times 3$ ප්‍රමාණයේ ලී ඝනකයක් අඟල් $1 \times 1 \times 1$ ප්‍රමාණයේ කුඩා ඝනකවලට සියුම් ලෙස කපා වෙන් කරන ලදී.

12. මෙම කුඩා ඝනක කීයක් කොළ පාට පැති දෙකක් සහිත වේ ද?

(1) 4 (2) 6 (3) 12 (4) 16 (.........)

13. වර්ග අඟල් එකක් පින්තාරු කිරීම සඳහා කොළ පාට තීන්ත මිලිලීටර එකක් අවශ්‍ය වේ නම්, කුඩා ඝනකවල පින්තාරු නොකරන ලද සියලු පැති පින්තාරු කිරීම සඳහා තීන්ත මිලිලීටර කීයක් අවශ්‍ය වේ ද?

(1) 6 (2) 12 (3) 54 (4) 108 (.........)

14. *A* නගරයේ සිට පෙරවරු 6.00 සිට සෑම මිනිත්තු 30 කට වරක් *B* නගරයට බස් රථයක් පිටත් වේ. *B* නගරයෙන් ද පෙරවරු 6.00 සිට සෑම මිනිත්තු 30 කට වරක් *A* නගරයට බස් රථයක් එම මාර්ගයේම පිටත් වේ. සෑම බස් රථයක් ම ගමනාන්තය දක්වා යාමට පැය තුනක කාලයක් ගත කරයි. *A* නගරයෙන් පිටත් වූ බස් රථයකට අතර මග දී *B* නගරයේ සිට එන බස්රථ කීයක් හමු වන්නේ ද?

(1) 6 (2) 9 (3) 11 (4) 12 (.........)

15. *A* හා *B* රූප දෙක එකට එක් කළ විට සෑදෙන සංයුක්ත රූපය පහත දැක්වෙන කවරක් ද?

(A) (B)

(1) (2) (3) (4) (.........)

16. දිගින් සමාන ලී පටි හයක් තිබේ. ඒවා භාවිත කර සෑදිය හැකි උපරිම සමපාද ත්‍රිකෝණ සංඛ්‍යාව කීය ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (.........)

කටුවැඩ සඳහා

Department of Examinations Sri Lanka

17. උපාලි, ගිනිකූරු යොදා ගනිමින් පහත දැක්වෙන පරිදි රෝම ඉලක්කම් සහිත සමීකරණයක් නිරූපණය කළේ ය.



මෙම සමීකරණය සම්බන්ධයෙන් කර ඇති පහත ප්‍රකාශ සලකා බලන්න.

(i) පියල් මෙසේ කියයි. "මට පුළුවනි එක ගිනිකූරක් විතරක් වෙන තැනක තියලා සමීකරණය නිවැරදි කරන්න."

(ii) ලාල් මෙසේ කියයි. "මට පුළුවනි එක ගිනිකූරක් විතරක් අයින් කරලා සමීකරණය නිවැරදි කරන්න."

(iii) ජයන්ත මෙසේ කියයි. "මට පුළුවනි එක ගිනිකූරක්වත් අල්ලන්නෙ නැතුව සමීකරණය නිවැරදි කරන්න."

මේ ප්‍රකාශ අතුරින්,

(1) (i) පමණක් සත්‍ය වේ. (2) (ii) පමණක් සත්‍ය වේ.

(3) (iii) පමණක් සත්‍ය වේ. (4) (i), (ii), (iii) සියල්ල සත්‍ය වේ. (.........)

18. දාදු කැටයක් තබා ඇති ආකාර තුනක් X, Y සහ Z යනුවෙන් පහත රූපයේ දැක්වේ. X පිහිටීමේ දී යටි මුහුණතේ ඇති අංකය කුමක් ද?



(1) 2 (2) 3 (3) 6 (4) 2 හෝ 3 (.........)

19. පහත දැක්වෙන රූපයේ පැති හතරක් සහිත රූප කීයක් ඇතුළත් ද?



(1) 22 (2) 24 (3) 25 (4) 28 (.........)

20. උඩුරාවණගේ උපන්දින සාදයට යහළුවෝ හත්දෙනෙක් සහභාගි වූහ. සෑම යහළුවෙකු ම අනෙක් සියලු යහළුවන් සමග අතට අත දුන්හ. එහි දී අතට අත දීම් කීයක් සිදුවිණි ද?

(1) 14 (2) 21 (3) 28 (4) 42 (.........)

කටුවැඩ සඳහා

Department of Examinations Sri Lanka

- අංක **21** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්න පහත තොරතුරු මත පදනම් වේ.
  - ✻ එක ම කාමරයක පදිංචි අමල්, කමල්, නිමල්, චමල් සහ සපුමල් යන පස්දෙනාගෙන් සෑම කෙනෙක් ම ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව සහ භූගෝල විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් හදාරන අතර කාමරය පිරිසිදු කිරීම ඔවුන් අතර බෙදාගෙන ඇත. ඒ අනුව සෑම කෙනෙක් ම සතියේ සඳුදා සිට සිකුරාදා දක්වා එක් දිනයක දී පමණක් කාමරය පිරිසිදු කරයි.
  - ✻ සපුමල් සත්ත්ව විද්‍යාව හදාරන්නා නොවන අතර අඟහරුවාදා කාමරය පිරිසිදු නොකරයි.
  - ✻ කමල් භූගෝල විද්‍යාව හදාරන්නා වන අතර සිකුරාදා කාමරය පිරිසිදු නොකරයි.
  - ✻ ගණිතය හදාරන්නා බ්‍රහස්පතින්දා කාමරය පිරිසිදු කරයි.
  - ✻ නිමල් සත්ත්ව විද්‍යාව හදාරන්නා වන අතර බදාදා කාමරය පිරිසිදු නොකරයි.
  - ✻ භෞතික විද්‍යාව හදාරන්නා සිකුරාදා කාමරය පිරිසිදු කරන නමුත් ඒ චමල් නොවේ.
  - ✻ අමල් සඳුදා කාමරය පිරිසිදු කරයි.

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

21. කමල් කාමරය පිරිසිදු කරන්නේ කවදා ද?
    (1) අඟහරුවාදා (2) බදාදා (3) බ්‍රහස්පතින්දා (4) සිකුරාදා (.........)

22. අමල් හදාරන විෂය කුමක් ද?
    (1) රසායන විද්‍යාව (2) ගණිතය (3) සත්ත්ව විද්‍යාව (4) භෞතික විද්‍යාව (.........)

23. සපුමල් හදාරන විෂය කුමක් ද?
    (1) රසායන විද්‍යාව (2) ගණිතය (3) සත්ත්ව විද්‍යාව (4) භෞතික විද්‍යාව (.........)

24. බ්‍රහස්පතින්දා කාමරය පිරිසිදු කරන්නේ කවුද?
    (1) චමල් (2) කමල් (3) නිමල් (4) සපුමල් (.........)

25. චමල් හදාරන විෂය කුමක් ද?
    (1) රසායන විද්‍යාව (2) ගණිතය (3) සත්ත්ව විද්‍යාව (4) භෞතික විද්‍යාව (.........)

කටුවැඩ සඳහා

[6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

- අංක **26** සිට **31** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත්** ඉර මත ලියන්න.

26. 'සඳ' සහ 'තරු' යහළුවන් දෙදෙනකි. එක් අයෙක් සඳුදා, අඟහරුවාදා සහ බදාදා බොරු කියන අතර සතියේ ඉතිරි සියලු දිනවල ඇත්ත කියයි. අනෙකා බ්‍රහස්පතින්දා, සිකුරාදා සහ සෙනසුරාදා බොරු කියන අතර ඉතිරි සියලු දිනවල ඇත්ත කියයි.

දිනක් ඔවුහු පහත දැක්වෙන ප්‍රකාශ කළහ.

* සඳ : මම සෙනසුරාදා දිනවල බොරු කියනවා
* තරු : මම හෙට බොරු කියනවා
* සඳ : මම ඉරිදා දිනවල බොරු කියනවා

මෙම ප්‍රකාශ සිදු කළ දිනය සතියේ කුමන දිනය ද?

(1) ඉරිදා (2) සඳුදා (3) බදාදා (4) සිකුරාදා (.........)

27. ගම්පොළයා ඔහුගේ යහළුවා රයිගමයාට පුතුන් තුන් දෙනෙකු සිටින බව දනියි.

* ගම්පොළයාට එම දරුවන්ගේ වයස් දැන ගැනීමට වුවමනා විය.
* රයිගමයා ඊට ඉඟියක් දුන්නේ මෙසේ ය.
* "එයාලගෙ වයස්වල ගුණිතය 36 යි."
* ගම්පොළයා ඔහුට තවත් තොරතුරු ඕනෑ බව පැවසුවේ ය. එවිට රයිගමයා තවත් ඉඟියක් දුන්නේ ය.
* "එයාලගෙ වයස්වල එකතුව අපේ ගෙදර අංකයට සමානයි."
* රයිගමයා ගෙදර අංකය දෙස බලා මෙසේ කීවේ ය.
* "වයස හරියට කියන්න නම් තවත් තොරතුරු ඕනෑ". එවිට රයිගමයා තවත් ඉඟියක් දුන්නේ ය.
* "මගේ වැඩිමල් ම දරුවා විතරක් පාසල් යනවා." එවිට ගම්පොළයා නිවැරදිව වයස් කීවේ ය.

මේ අනුව වැඩිමල් ම පුතාගේ වයස අවුරුදු කීය ද?

(1) 6 (2) 9 (3) 12 (4) 18 (.........)

28. a, b, c හා d යනු සංඛ්‍යා හතරකි. $a:b=2:3$, $b:c=4:5$ සහ $c:d=6:7$ නම්, $a:d$ සමාන වන්නේ කවරකට ද?

(1) $10:22$ (2) $16:35$ (3) $44:61$ (4) $12:35$ (.........)

29. A, B සහ C ට එකතුවී දින 10 කින් එක්තරා වැඩක් නිමකළ හැකි ය. A සහ C එකතුවී එය දින 15 ක දී නිමකරන අතර C සහ B එකතුවී එය දින 20 ක දී නිම කරති. කරන වැඩ ප්‍රමාණයට සමානුපාතිකව ඔවුන්ට වැටුප් ගෙවනු ලබයි නම්, A, B සහ C ගේ වැටුප් අතර අනුපාතය කුමක් ද?

(1) $3:2:1$ (2) $1:2:3$ (3) $2:1:3$ (4) $3:1:2$ (.........)

30. පියෙකුගේ සහ පුතෙකුගේ වයස්වල එකතුව අවුරුදු 100 කි. අවුරුදු පහකට පෙර ඔවුන්ගේ වයස් අතර අනුපාතය 2:1 ක් විය. අවුරුදු දහයකට පසු පියාගේ සහ පුතාගේ වයස් අතර අනුපාතය කුමක් ද?

(1) $5:3$ (2) $2:1$ (3) $4:2$ (4) $4:3$ (.........)

කටුවැඩ සඳහා

Department of Examinations Sri Lanka

31. පහත දැක්වෙන කුමන වෙන් රූප සටහන පිරිමි, පියවරු සහ ගුරුවරු අතර සම්බන්ධය පෙන්නුම් කරයි ද?



(1) (2) (3) (4) (.........)

● අංක **32** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ රූප පහක් බැගින් දී ඇත. ඒවා එක්තරා වෙනස් වෙමින් යන රටාවකට පෙළගස්වා ඇත. එම රටාව අනුව **?** සලකුණ මඟින් පෙන්නුම් කරන ස්ථානයට වඩාත් ම යෝග්‍ය රූපය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

32.





(1) (2) (3) (4) (.........)

33.





(1) (2) (3) (4) (.........)

කටුවැඩ සඳහා

Department of Examinations Sri Lanka

34.





(1) (2) (3) (4) (.........)

35.





(1) (2) (3) (4) (.........)

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

36. පිරිමි ළමයින්ගේ පෝළිමක සිරිමල් ඉදිරිපස සිට 7 වැන්නා වන අතර විමල් පසු පස සිට 12 වැන්නා වේ. ඔවුන් එකිනෙකා ස්ථාන හුවමාරු කළ විට සිරිමල් ඉදිරිපස සිට 22 වැන්නා වේ. පෝළිමේ පිරිමි ළමයි කී දෙනෙක් සිටිත් ද?

(1) 19 (2) 31 (3) 33 (4) 34 (.........)

37. පෙට්ටියක් තුළ එකිනෙකට වෙනස් පාට තුනකින් කොළ, කහ සහ නිල් වීදුරු බෝල හතර බැගින් වීදුරු බෝල 12 ක් ඇත. ඔබ ඇස් දෙක පියා ගෙන අහඹු ලෙස වරකට බෝලයක් බැගින් ගන්නේ නම්, එක ම වර්ණයකින් බෝල දෙකක් ලැබීම සඳහා අවම වශයෙන් බෝල කීයක් ගත යුතු ද?

(1) 3 (2) 4 (3) 5 (4) 6 (.........)

කටුවැඩ සඳහා

Department of Examinations Sri Lanka

38. පවුලක පස්දෙනෙකුගේ වයස්වල එකතුව 107 කි.

* නයනා සහ අමාලිගේ වයස්වල එකතුව 29 කි.
* අමාලි සහ පසන්ගේ වයස්වල එකතුව 44 කි.
* පසන් සහ ජිතාරිගේ වයස්වල එකතුව 57 කි.
* ජිතාරි සහ සචිනිගේ වයස්වල එකතුව 46 කි.

මේ අනුව නයනාගේ වයස කුමක් ද?

(1) 12 (2) 17 (3) 25 (4) 32 (.........)

39. මිනිසුන් පස්දෙනෙකුට නිවසක් දින 16 කින් තැනිය හැකි නම්, සියලු ම මිනිසුන් එක ම කාර්යක්ෂමතාවකින් වැඩ කරන්නේ යැයි උපකල්පනය කළ විට මිනිසුන් දෙදෙනෙකුට එම නිවස ඉදිකිරීමට කොපමණ කාලයක් ගත වේ ද?

(1) 12 (2) 18 (3) 40 (4) 48 (.........)

40. මෝටර් රථයක් ගමනක පළමු අර්ධය පැයට කිලෝමීටර 40 ක සාමාන්‍ය වේගයකින් ද දෙවන අර්ධය පැයට කිලෝමීටර 60 ක සාමාන්‍ය වේගයකින් ද ගමන් කරයි. ඒ අනුව මුළු ගමනේ සාමාන්‍ය වේගය පැයට කිලෝමීටර කීය ද?

(1) 36 (2) 48 (3) 50 (4) 55 (.........)

- අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ කිසියම් රටාවකට සංඛ්‍යා යොදන ලද රූප හතරක් බැගින් දී ඇත. එම රටාවට අනුව එක් එක් රූපසටහනේ **?** සලකුණ සහිත ස්ථානයට යෝග්‍ය සංඛ්‍යාව තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

41.



(1) 8 (2) 10 (3) 12 (4) 15 (.........)

42.



(1) 3 (2) 4 (3) 6 (4) 7 (.........)

කටුවැඩ සඳහා

Department of Examinations Sri Lanka

43.

(1) 15 (2) 30 (3) 45 (4) 60 (.........)

44.



(1) 84 (2) 176 (3) 186 (4) 212 (.........)

45.

(1) 1 (2) 2 (3) 3 (4) 4 (.........)

- අංක **46** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

46. පාසලක සිටින ගැහැනු ළමයින් 100 දෙනෙකු අතර කරන ලද සමීක්ෂණයක දී 83 දෙනෙකුට සුදු බෑග් ද 77 දෙනෙකුට කළු සපත්තු ද 62 දෙනෙකුට කුඩ සහ 95 දෙනෙකුට වතුර බෝතල ද තිබිණි. මෙම තොරතුරු අනුව අයිතම හතරම සතු විය හැකි අවම ගැහැනු ළමයින් සංඛ්‍යාව කොපමණ ද?

(1) 15 (2) 17 (3) 21 (4) 28 (.........)

47. පැයට කිලෝමීටර 50 ක වේගයෙන් ගමන් කරන දුම්රියක් කිලෝමීටර 2.75 ක් දිග උමගකට ඇතුළු වෙයි. දුම්රියෙහි දිග කිලෝමීටර 0.25 කි. දුම්රියට උමග පසුකර යාමට මිනිත්තු කීයක් ගත වේ ද?

(1) 0.3 (2) 3.3 (3) 3.6 (4) 4.5 (.........)

කටුවැඩ සඳහා

Department of Examinations Sri Lanka

48. පහත රූපයේ පෙනෙන පැතිවලින් අඳුරු කරන ලද භාගය කුමක් ද?



(1) $\frac{13}{36}$ (2) $\frac{7}{18}$ (3) $\frac{11}{36}$ (4) $\frac{1}{9}$ (.........)

49. ඔබ සතුව කුඩා ඝනක 59 ක් පමණක් තිබේ. වෙනත් විශාල ඝනකයක් තැනීම සඳහා මින් ඉවත් කළ යුතු අවම ඝනක සංඛ්‍යාව කොපමණ ද?

(1) 12 (2) 16 (3) 27 (4) 32 (.........)

50. පහත රූපයේ දැක්වෙන වෘත්ත හතර බයිසිකල් මංතීරු හතරක් නිරූපණය කරයි.

* A, B, C සහ D බයිසිකල්කරුවන් හතර දෙනෙක් පෙරවරු 6 ට මධ්‍යයේ (P) සිට ගමන් ආරම්භ කරති.
* එක් එක් බයිසිකල්කරු වෙන් වෙන් මංතීරුවල පැද යන අතර, A පැයට කිලෝමීටර 3 ක වේගයෙන් ද B පැයට කිලෝමීටර 6 ක වේගයෙන් ද C පැයට කිලෝමීටර 12 ක වේගයෙන් ද D පැයට කිලෝමීටර 15 ක වේගයෙන් ද පදිති.
* එක් එක් මංතීරුව දිගින් කිලෝමීටර එකකි.

එසේ නම්, ඔවුන් පළමු වරට මධ්‍යයේ (P) නැවත හමුවන්නේ කීයට ද?



(1) පෙරවරු 6.30 (2) පෙරවරු 7.00 (3) පෙරවරු 7.45 (4) පෙරවරු 8.00 (.........)

කටුවැඩ සඳහා

* * *

Department of Examinations Sri Lanka